ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය
ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් සහතික පත්‍ර පාඨමාලාව
**OSC2402:** කුඩා ව්‍යාපාර කළමනාකරණය
අවසාන පරීක්ෂණය – **2024/2025**
කාලය – පැය දෙක **(02)** යි

**දිනය: 2025 මැයි 31** | **වේලාව: ප. ව. 01.30 – ප. ව. 03.30**

උපදෙස් :

- **ඕනෑම ප්‍රශ්න හතරක් (04) සඳහා පිළිතුරු සපයන්න.**
- **සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.**

1. (අ) ශ්‍රී ලංකාව තුළ කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ඔබ විසින් සලකා බැලිය යුතු ප්‍රධාන සාධක කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

(ආ) කුඩා ව්‍යාපාරයක වර්ධනයේ අවධි සහ ඒ ඒ අවධීන් තුළ කළමනාකරණ ශ්‍රිතයන් (management functions) ක්‍රියාත්මක කරනු ලබන ආකාරය සාකච්ඡා කරන්න.
(ලකුණු 15)

2. "ව්‍යාපාර ආචාරධර්ම (Business Ethics) බලපානු ලබන්නේ මහා පරිමාණ ව්‍යාපාර සඳහා පමණි. බොහෝ කුඩා ව්‍යාපාර තනි පුද්ගල හිමිකාරීත්වයක් යටතේ පවතින නිසාත්, ප්‍රමාණයෙන් කුඩාවන නිසාත් ඒවාට ව්‍යාපාර ආචාරධර්මයන්ට අනුගත වීමේ අවශ්‍යතාවක් නොමැත."

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුර උදාහරණ සමඟ සනාථ කරන්න.
(ලකුණු 25)

3. (අ) ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර දිනෙන් දින වැඩි වශයෙන් අසාර්ථක වීමට හේතු හතරක් (04) උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

(ආ) කුඩා ව්‍යාපාර හිමිකරුවෙකුට තම ව්‍යාපාරය අසාර්ථක වීමෙන් වළක්වා ගැනීමට අනුගමනය කළහැකි උපාය මාර්ග මොනවාද? පැහැදිලි කරන්න.
(ලකුණු 15)

4. (අ) කුඩා ව්‍යාපාර සඳහා මානව සම්පත් කළමනාකරණ කාර්යයන් (Human Resource Management practices) වැදගත් යැයි ඔබ සිතනවාද? ඔබේ පිළිතුර උදාහරණ සමඟ සනාථ කරන්න.

(ලකුණු 10)

(ආ) ඔබ කුඩා ව්‍යාපාර හිමිකරුවෙකුනම්, ඔබ ආයතනයේ මානව සම්පත් සඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ඔබ අනුගමනය කරනු ලබන පියවරයන් මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 15)

5. (අ) ඔබගේ අදහස අනුව, වත්මන් ව්‍යාපාර පරිසරය තුළ නොනැසී පැවතීම සඳහා කුඩා ව්‍යාපාර හිමිකරුවෙකු සතුවිය යුතු ප්‍රධානතම කුසලතා පහ (05) මොනවාද? සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ) කුඩා ව්‍යාපාර හිමියන්ගේ කුසලතා වර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග, දැඩි තරඟකාරීත්වයකින් යුතු වර්ථමාන ව්‍යාපාර පරිසරයේ ඇති අභියෝගවලට ඔවුන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත්යැයි ඔබ සිතනවාද? ඔබේ පිළිතුර සැබෑ ලෝකයෙන් උදාහරණ දක්වමින් සනාථ කරන්න.

(ලකුණු 15)

**- සියලු හිමිකම් ඇවිරිණි -**